## වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# ටෙන්ඩර් කැඳවීම

## ගාල්ල, වලහන්දූව වතුයායේ කුරුඳු වගාව කුරුඳු කෝටු කිලෝ ලෙස අලෙවි කිරීම

**ටෙන්ඩර් අංකය - SLSPC/Pro/TE/Cinnamon-Whalahaduwa/2026/66**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් ගාල්ල, වලහන්දූව වතුයායේ ක්ෂේත්‍ර අංක 05 සහ 05 A හි පිහිටි අක්කර 07ක කුරුඳු වගාව, කුරුඳු කෝටු ලෙස අලෙවි කිරීම සඳහා සුදුසුකම්ලත් ගැනුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

අදාළ කුරුඳු වගාව ස්ථානීයව නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව, කුරුඳු කෝටු කිලෝවක මිල සඳහන් කරමින් ලංසු ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ලේඛන 2026 ජූලි මස 21 වන දින පස්වරු 3.30 දක්වා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ වලහන්දූව වතු කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලේඛන ගාස්තුව රු. 1,000.00 වන අතර, ආපසු ගෙවනු ලබන ලංසු ඇප මුදල රු. 10,000.00 කි.

මුද්‍රා තැබූ ලංසු 2026 ජූලි 22 වන දින පස්වරු 2.00 ට හෝ ඊට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10 යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු අතර, නියමිත වේලාවෙන් පසු ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු එදින පස්වරු 2.00 ට ප්‍රධාන කාර්යාලයේදී විවෘත කරනු ලබන අතර, ලංසුකරුට හෝ ඔහුගේ / ඇයගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැක.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව වෙත ඕනෑම ලංසුවක් හෝ ලංසු කොටසක් පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම හෝ අවශ්‍ය පරිදි වෙනස් කිරීමේ පූර්ණ අයිතිය හිමි වන අතර, එම තීරණය අවසාන තීරණය වේ.

**සභාපති,**
**ටෙන්ඩර් කමිටුව,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10.**

**දුර : ප්‍රධාන කාර්යාලය 0114-194879, වලහන්දූව වතුයාය - 071-8287420**

**දිනය : 2026.07.07**